# සමරු කලාපය

2018

# ස්පර්ශනී

## යහපත් මාධ්‍ය සංස්කෘතියක් උදෙසා

## සන්නිවේදන හා මහජන සබඳතා උළෙල

mass.comm
DEPARTMENT OF MASS COMMUNICATION

ජනසන්නිවේදන අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

# යහපත් මාධ්‍ය සංස්කෘතියක් සඳහා වූ සංවාදයක්

මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස

අප වසන කාලය වඩාත් සංකීර්ණ වී ඇත්තේ සිද්ධි අවකාශයන් තොරතුරු වාර්තා කිරීම හා විවරණය කිරීම ඔස්සේ ඇතිවන ප්‍රකම්පනය නිසා යැයි මට සිතේ. අප ගතකරන්නේ තොරතුරු සමාජයකය. මේ පිළිබඳව අදහස් දැක්වූ මෙරට සිටි විශිෂ්ට ගණයේ පර්යේෂකයෙකු හා විද්‍යා ලේඛකයෙකු වූ ආතර් සී. ක්ලාක් ප්‍රකාශ කළේ ජනමාධ්‍ය විසින් නූතන ලෝකයේ නොබෝ කලකින් පරිසර දූෂණයක් සිදුවන බවයි. මෙහිලා ඔහු ප්‍රකාශ කරනු ලැබුවේ අපේ ඇස, කන, නාසය ඇතුළු පංචේන්ද්‍රියන් ඔස්සේ ලබන අරමුණු සඳහා විවිධ මාධ්‍යන්ගේ දෘශ්‍ය, ශ්‍රව්‍ය, ගන්ධ, ස්පර්ශ, රස වශයෙන් ලැබෙන තොරතුරු හා සන්නිවේදනයන් අප ජීවිතය සංකීර්ණ කරවන බවයි. මේ බව අප සමාජයේ සිදුවන සිදුවීම් මගින් ඇතිවන ප්‍රකම්පනයන් හා අප සසල කර වන සංසිද්ධීන්ගෙන් පෙනීය යි.

සන්ධ්‍යා කාලයේ රූපවාහිනී වැඩසටහනක් නරඹමින් සිටි මම එකවර තැතිගනු ලැබුවේ මහ මාර්ගයේ සවිකර තිබුණු ස්වයංක්‍රියව රූගත වන රූපවාහිනී කැමරා මගින් රූගත වූ සංසිද්ධියක් දැකීමෙනි. පාසල් වියේ දරුවන් දෙදෙනෙකු පාසලේ ඇතිකර ගන්නා ලද අඩදබරයක් ඉන් ඔබ්බට ගෙන යමින් සති අන්ත පන්තියක් අවසන් වී ගෙදර යන විට එම පාසල් මිතුරා පිහියක් අමෝරා ගෙනවිත් සිය මිතුරාට ඇණ මරා දමන ආකාරය එම රූපවාහිනී තිරයේ දර්ශනය විය. පිහියක් අමෝරාගෙන හබා යන සිසුවා පසුකරගෙන යන වාහන, ත්‍රීවිල, මෝටර් බයිසිකල්, රූප රාමුවේ පැවතිණි. අප සමාජය යොමු වී තිබෙන්නේ කවර දිශාවකට ද? එම ප්‍රවෘත්තිය කියවා ඊට පසුදින දිනපතා පුවත්පතක ප්‍රවෘත්තිය කියවන විට මා දුටුවේ සිය පෙම්වතියගේ ගෙල මිරිකා මරා දමන තරුණයකුගේ ප්‍රවෘත්තියයි. ගෙල මිරිකා මරා දමන එම මිතුරියගේ හා මිතුරාගේ ප්‍රචණ්ඩ ක්‍රියාව තවත් මිතුරෙකු විසින් ජංගම දුරකථනයකින් රූගත කිරීම එම ප්‍රවෘත්තියේ අන්තර්ගත විය. අප ගත කරන්නේ කොතරම් සාහසික සන්නිවේදනමය සමාජයක ද? අනාගතය භාර තරුණ පරපුර මාධ්‍ය භාවිතය, මාධ්‍ය

අත්දැකීම, මාධ්‍ය ඔස්සේ ලබන සංජානනය කොයි දිශාවකට ගමන් කර සිටී ද යන්න ගැටළු සහගත ය. අප නව මාධ්‍ය සංස්කෘතියක් පිළිබඳව සංවාදය ගොඩනගන්නේ මෙවැනි පසුබිමක සිට ය. ඉවක් බවක් නොමැති තරම් සෑම උදෑසනක ම කන්දොස්කිරියාවක් වන සේ තරමට ගීතිකා, යාතිකා, පිරිත්, උපදේශ, වැනි වසාගෙන යන තරම් ය. ඒවා වරෙක එකිනෙක සංඝට්ටනයන් පරිසරයේ ඝෝෂාව නිර්මාණය වේ. එම දාර්ශනිකයින්, ශාස්තෘන් වහන්සේලා කියූ ඉතා වටිනා දේශනා සවන් දීමට හැකියාවක් තිබේද යන්න වරෙක මා හට පැනනැගෙන ගැටලුවකි. සෑම උදෑසනක ම මෙරට විද්‍යුත් ගුවන්විදුලි, රූපවාහිනී නාලිකා ආරම්භ වන්නේ සුබවාදී ආගමික පණිවිඩවලිනි. බොහෝ නාලිකා දැන් අලුතින් විවිධ ආගමික සම්ප්‍රදායන්වලට අයත් ආශිර්වාදමය වැඩසටහන් එකතු කර තිබේ. මෙම වැඩසටහන්වලින් අප සමාජයේ බහුතර ශ්‍රාවකයින්, ප්‍රේක්ෂකයින්, පාඨකයින් තුළ කිසියම් සංජානනයක් ඇතිකර තිබේ ද? අවම වශයෙන් ආදරය, සෙනෙහස, ගරුත්වය, පිළිගැනීම, සමානාත්මතාවය, එකිනෙකාට සැලකීම, එකිනෙකා ඉවසීම, උපශාන්ත, අවිහිංසකත්වය, ප්‍රචාරය කිරීම දැන්වීම දැනවීම අර්ථාන්විත වී තිබේ. නව මාධ්‍ය සංස්කෘතියක් පිළිබඳව කතිකාව ගොඩනැගෙන්නේ මෙම යථාර්ථය සමග ය. ජන සන්නිවේදන මාධ්‍ය සියල්ල ප්‍රාග්ධන කේන්ද්‍රීය බවින් වෙලී වසාගෙන යමින් තිබේ. සෑම නාලිකාවක් ම සෑම වැඩසටහනක්, සෑම ප්‍රකාශනයක්ම සෘජු අවකාශයන් විකාශන කාලයක් වසාගෙන යන්නේ දැන්වීම් සමග ය. වෙළඳ දැන්වීම් අත්‍යවශ්‍ය ය. ආරම්භක යුගයේ වෙළඳ දැන්වීම් ආරම්භ වූයේ නිෂ්පාදන හා සේවා කටයුතු පිළිබඳව ජනතාවට දැනවීමට හා දැන්වීමට ය. නමුත් අද වන විට වෙළඳ දැන්වීම් තුළ මිථ්‍යාව, නුගත්කම, අවිද්‍යාව, අසත්‍ය අන්තර්ගත වෙමින් පවතී.

මා පසුගියදා අත්වූ එක් අත්දැකීමකින් කතිකාව අවසන් කිරීමට මා කැමැත්තෙමි. ගොවි සමාජයක හමුවක් ඇමතීමට මට අවස්ථාව හමු විය. එහි ගොවිජන කණ්ඩායම මෙරට කිරි නිෂ්පාදකයෝ ය. මෙරට දියර කිරි නිෂ්පාදනය කිරීම පෝෂණ අවශ්‍යතාවයක් වගේ ම මෙරට සමාජ සංවර්ධන අවශ්‍යතාවයක් ලෙස මම එහිදී විස්තර කළෙමි. එහිදී එම සාකච්ඡාවට මැදිහත් වූ ප්‍රතිපත්ති තීරකයෙකු විස්තර කළ එක් කරුණක් මා වෙත යම් ප්‍රශ්නකාරී සන්නිවේදන ගැටලුවක් නිර්මාණය කළේ ය. අපේම රටේ කිරි, අපේ කිරි, දේශීය කිරි යැයි එම වෙළඳ දැන්වීම්වල සඳහන් වී තිබුණි. එම සියලුම නිෂ්පාදන විදේශ රටවලින් ආනයනය කරන ලද පිටිකිරි, දියර කිරි බවට පත්කොට පසුව ඒවා කිරි ආහාර යෝගට්, යෝගට් කිරි, දියර කිරි, පිටිකිරි වශයෙන් මෙරට අලෙවි කරයි. එම සාකච්ඡාවේදී මා දැනගත් පරිදි මෙරට වෙළඳපළේ ඇති කිරි නිෂ්පාදකයින් අතරින් දෙදෙනෙකු හැර අන් සියල්ලෝම විදේශ රටවලින් ආනයනය කරන පිටිකිරි දියර බවට පත් කොට පසුව පසු නිෂ්පාදන කරන්නේ ය. ජනමාධ්‍ය ඉටුකරන්නේ කවර කාර්යභාරයක් ද? මිථ්‍යාව හා නුගත්කම පැතිර වීම හරහා දුප්පත්කම හා අඥානභාවය ව්‍යාප්ත වේ. මහා දාර්ශනිකයෙකු වූ හැරල්ඩ් ලැස්කිට අනුව නිවැරදි තොරතුරු නොලබන මිනිස්සු ඉක්මනින් හෝ පමා වී කාගේ හෝ වහලෙකු බවට පත්වනු ඇත.